ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.09.05 **චක්‍රලේඛ අංක : 67 /2026**

දිසා කොමසාරිස් හා සහාය දිසා කොමසාරිස් (පුහුණු) වෙත,

**<u>ගිල්වෙල් සුහද හමුව</u>**
**<u>2026 නොවැම්බර් මස</u>**

2026 වාර්ෂික ගිල්වෙල් සුහද හමුව නොවැම්බර් මස දී පැවැත්වීමට කටයුතු සංවිධානය කරන අතර පැවැත්වෙන දිනය, ස්ථානය හා ලියාපදිංචි ගාස්තුව ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ.

මෙහිදී ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මගින් ඔබ සඳහා විශේෂ වැඩසටහන් සංවිධානය කර ඇති බව සතුටින් දන්වා සිටිමු. ඒ සඳහා ඔබ දිසාවෙන් ගිල්වෙල්ධාරීන් වැඩිම පිරිසක් සහභාගී කරවීමට ඔබ සැමට මෙයින් ආරාධනා කරමු.

ගිල්වෙල් සුහද හමුවේ දී ලී පදක්කම් ලබා දීමට සැලසුම් කර ඇති බැවින් V වන අදියර ව්‍යාපෘති සම්පූර්ණ කර ගුරු උපදේශක වාර්තාව සමග ජාතික බාලදක්ෂ මූලස්ථානයට **2026 සැප්තැම්බර් මස 30 වන දිනට පෙර ලැබීමට සැලස්විය යුතුයි.**

2026 සැප්තැම්බර් මස 30 වන දිනට මාස 06 ක සේවා කාලය සම්පූර්ණ කරන නායකයින් සඳහා 2026 ඔක්තෝම්බර් මස 10 දක්වා කාලය ලබා දෙනු ලැබේ. මේ වන විටත් මාස 06 ක සේවා කාලය සම්පූර්ණ කර ඇති නායක/නායිකාවන් හැකි ඉක්මනින් ව්‍යාපෘති වාර්තා ගුරු උපදේශක හරහා ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත ලබා දීමට කටයුතු කරන ලෙස දැනුම්වත් කරන්න.

ව්‍යාපෘති වාර්තා ලැබෙන පිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

මේ සඳහා ඔබගේ ක්‍රියාශීලි දායකත්වය ගෞරවයෙන් අපේක්ෂා කරමි.

ස්තූතියි.
මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

කර්නල් පද්මලාල් පෙරේරා
ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්

නීතිඥ මනෝජ් නානායක්කාර
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

Manoj Nanayakkara
(Attorney-at-Law)
Chief Commissioner
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka

<u>පිටපත් -</u> 1. ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියළුම කොමසාරිස් වරුන් - කා.දැ.පි.
2. ගරු සභාපති, ගරු විධායක සභා සභාපති, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික - කා.දැ.පි.

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka.
Tel : +94 112 433131 / +94 112 433512
Fax : +94 112 433131
E-mail : slsaheadq@gmail.com
Web : www.scout.lk